Special issue of the magazine

# Pawura Digital Magazine

2023 December 24 Sunday

23 Issue



නව්‍යකරණයෙන් ඉදිරියට
ඩිජිටල් කළාවේ නවතම පෙරළිය
Pawura Digital Magazine

# කිතු උපතින් සැරසෙන නත්තල් අසිරිය

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත සිදු වූ අසිරිමත් නත්තල සෑම වසරකම දෙසැම්බර් මස 25 දිනයේ ලොව පුරා වෙසෙන මිලියන7.3ක් පමණ වූ කතෝලික මෙන්ම කිතුණු බැතිමතුන් උත්කර්ෂවත් අන්දමින් සමරනු ලබනවා. කතෝලික ජනතාව නත්තලේ දී මෙසේ සිහිපත් කරනු ලබන්නේ මෙලොව සියළු දෙනාගේ පාප උදෙසා වන්දි ගෙවීමට දෙවියන් වහන්සේගේ ඒක ජනිත පුත්‍රයා වන ජේසුස් වහන්සේ මිනිස් වෙසින් කන්‍යා මරියා උත්තමාවියගේ කුසින් මෙලොවට ජනිත වීමයි.

වර්තමානය වන විට නත්තල් උත්සවය කිතුණු බැතිමතුන් විසින් පමණක් නොව වෙනත් ආගම්වල ජනතාව විසින් ද සංස්කෘතික උත්සවයක් ලෙස සමරනු ලබනවා.ශ්‍රී ලංකාවේ මුළු ජනගහණයෙන් 7%ක් පමණ වන කතෝලික බැතිමතුන් රට පුරා පිහිටි කතෝලික දේවස්ථාන වලදී දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රී 12 ට හා දෙසැම්බර් 25 වන දින උදෑසන සිය ආගමික වතාවත් වල යෙදෙමින් නත්තල් දේව මෙහෙයන් සිදු කරනු ලබනවා.

'මෙසායා' නැතහොත් තෝරාගත් තැනැත්තා යන නමින් හැඳින්වෙන ජේසුස් වහන්සේ, මරියා නමැති කන්‍යාවගෙන් උපත ලැබූ බව කිතුණු බැතිමතුන්ගේ විශ්වාසයයි. මෙම අසිරිමත් නත්තල පිළිබඳ ව ශුද්ධ වූ බයිබලයේ 'ලූක් සහ මතෙව්' යන කතුවරුන් විසින් එසේ ලියා දක්වා ඇති අතර



ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ බෙත්ලෙහෙම් නුවර දී මරිය තුමියට සහ තම සුරැකි පියා වන ජුසේ තුමාට දාව ඉපදුණු බව එහි සඳහන් වේ. ඉතිහාසගත කතා පුවත්, බයිබලය හා ප්‍රසිද්ධ සම්ප්‍රදායට අනුව මෙම උපත ගව ලෙනක දී සිදු වූ බව කියැවෙන නමුත් බයිබලයේ සඳහන් වන පරිදි එය ගව ඔරුවක දී සිදු වී ඇත. එය අදටත් බෙත්ලෙහෙම් නුවර ජේසුස් වහන්සේ උපත ලද ස්ථානයේ ඉදි කර ඇති දේවස්ථානයට පහළින් පිහිටා තිබේ. දේව දූතයකු විසින් මෙම ගවලෙන අසල සිටි එඬේරුන් හට ජේසුස් වහන්සේගේ උපත ගැන පවසා තිබේ. ඉන්පසු ඔවුන් බිළිඳු ජේසුතුමන් බැහැදැකුමට ගොස් ඇති අතර එතුමන් දුටු පළමු කණ්ඩායම ද ඔවුහු වෙති. ජේසුස් වහන්සේගේ උපත තුළින්, එතුමාගේ උපතට වසර ගණනාවකට පෙර පවසා තිබූ අනාවැකි සම්පූර්ණ වී ඇති බව ක්‍රිස්තු භක්තිකයෝ විශ්වාස කරති.

ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස පමණ වන තෙක් කිතු උපත සැමරීමක් සිදු නොකළ අතර සැමරුම් ආරම්භයත් සමඟ එදා සිට අද දක්වාම ක්‍රිස්තියානි සභාව ජේසු තුමන්ගේ උපන් දිනය උදා වන තුරු, සූදානම් වීමේ කාලය තුළ, විවිධ ආගමික කටයුතු වල නිරත වේ. කුඩා ළමුන් මෙන් ම වැඩිහිටි කිතුණු ජනතාව ද ක්‍රිස්තු තුමන්ගේ උපත සිහිපත් කෙරෙන නාට්‍ය රඟ දැක්වීමේ සහ නත්තල් කැරොල් ගීත ගායනා කිරීම සිදු කරති.



මේ කාලයට සෑම කිතුණු නිවෙසකම ජේසුතුමන් ඉපදුණු ගවලෙන සහ අදාළ චරිත කලාත්මක ප්‍රතිරූප වලින් නිරූපණය කෙරෙන අතර මෙම ප්‍රතිරූප අතරින් ජේසුතුමන් බැලීමට පැමිණි රජ තුන් කට්ටුවට ද වැදගත් ස්ථානයක් හිමි වේ. ඔවුන් බෙත්ලෙහෙමේ තරුව නමින් හැඳින්වෙන වල්ගා තරුව පසුපස පැමිණ, ජේසුතුමන් වෙත රත්තරන්, සුවඳලාටු සහ සුවඳ දුම් පුද කර ඇත. එසේම විවිධ සැරසිලි ද මෙම නත්තල් සමය තුළ දැක ගැනීමට හැකි සුවිශේෂී අංග අතර වේ. ඒ අතරින් නත්තල් ගස ප්‍රධාන ස්ථානයක් ගන්නා අතර නත්තල් ගස්, විදුලි බුබුලු සහ විසිතුරු සැරසිලි වලින් අලංකාර කරනු ලැබේ. මේ නත්තල් ගසේ මූලාරම්භය සිදු ව ඇත්තේ ජර්මනියෙන් ය. නත්තල් උත්සව දිනයේ දී පවුලේ සාමාජිකයින් අතර සහ යහළුවන්, නෑදෑයින්, අසල්වැසියන් අතර තෑගි හුවමාරු කර ගැනීම ද විශේෂත්වයකි. සාමය, සතුට සහ ප්‍රේමය මෙමඟින් නිරූපණය කරයි. කෙසේ නමුත් මෙම නත්තල් සමයේද තමා සතු දේ අනෙකා සමග බෙදා හදා ගනිමින් ජේසු සමිඳුන් ලොවට දායාද කළ සාමයේ පණිවුඩය සකල ජනයා අතර විහිදුවාලීමට ලෝවාසී කිතුණු බැතිමතුන් සූදානම් වෙමින් සිටියි.

ලෝවාසී සියළුම දෙනාට ප්‍රේමය , සතුට හා සාමය සපිරි සුභ නත්තලක් වේවායි පවුර අපගේ පැතුමයි..!



සටහන -
ප්‍රබුද්ධිකා හේරත්

# නත්තලේ කෑම මේසය හැඩ කරන අමුත්තෝ





උඳුවප් මාසයේ සීතල උදාවත් සමඟ අපගේ සිහියට එන්නේ නත්තලයි. නත්තල කිතුණුවන්ට සුවිශේෂී වූ උත්සවයක් ලෙස නම් කෙරුනද ආගම් භේදයකින් තොරව සියළු දෙනාම නත්තලට ප්‍රිය කරයි. සාමයේ පණිවිඩය ලොවට ගෙන ආ ජේසුස් වහන්සේගේ උපත මුල් කරගෙන එදින කිතුණු වැසියන් නත්තල සමරනු ලබයි. එකිනෙකා හා ආහාරපාන බෙදාහදා ගනිමින් එදින විනෝදයෙන් ගත කරන අතර නත්තල් කෑම මේසයට මෙදින හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. මේ නිසාම කිතුණු වැසියන් තම නත්තල වෙනුවෙන්ම සුවිශේෂී වූ ක්‍රිස්මස් කුකීස් සහ ක්‍රිස්මස් කේක් යන කෑම දෙවර්ගය තම නත්තල් කෑම මේසයට එකතු කරන්න අමතක නොකරයි. ඔයාගේ නත්තල් කෑම මේසයටත් අඩු වියදමකින් මෙම ආහාර දෙවර්ගය සාදාගන්න ආකාරය බලමු.

01. ක්‍රිස්මස් කුකීස්

අවශ්‍ය ද්‍රව්‍ය : පිටි කෝප්ප 1 ½



සීනි කෝප්ප 1 ½
බිත්තර 01
වැනිලා එසන්ස් තේ හැඳි 01
බටර් 225 g

සාදා ගන්නා ආකාරය : මුලින්ම අවශ්‍ය ද්‍රව්‍ය සියල්ල භාජනයට දමා හොඳින් ගසා ගන්න.

- හොඳින් ගසාගත් පසු මිශ්‍රණයෙන් තමන් කැමති ප්‍රමාණයක කුඩා බෝල සකස් කර ගන්න.
- සාදා ගත් බෝල තුනී කර තමන් කැමති හැඩයකට සකස් කර ගන්න. (තරු හැඩයට , නත්තල් ගසක හැඩයට ආදී වශයෙන් වෙළඳපළෙහි ඒ වෙනුවෙන් ඇති අච්චුවකින් මෙය ඉතා පහසුවෙන් සිදු කර ගත හැකිය.)
- කැමති ආකාරයට කපාගත් පිටි මිශ්‍රණය බේකින් ට්‍රේ එකක තබා අවන් එක ආධාරයෙන් සෙල්සියස් අංශක 100 උෂ්ණත්වය යටතේ විනාඩි 2 බේක් කරගන්න.
- නිවුණු පසු නත්තල් කෑම මේසයට එක් කරන්න.

02. ක්‍රිස්මස් කේක්

අවශ්‍ය ද්‍රව්‍ය : පලතුරු මිශ්‍රණය සඳහා



කරන්ට් - 100
රේසින්ස් - 100
සුල්තානා - 100
පුහුල් දෝසි - 200
ඉඟුරු දෝසී - 200
චෙරි - 100
චව් චව් - 100
කජු - 100
රට ඉඳි - 50
වයින් මේස හැඳි 06

කරාබු නැටි 8 , සාදික්කා , වසාවාසි, කුරුඳු පොතු කැබැල්ලක් බ්ලෙන්ඩර් කර සාදාගත් කුළුබඩු මිශ්‍රණ මේස හැඳි - 02
බටර් - 100
සීනි - 200
බිත්තර කහ මද - 06
බිත්තර සුදු මද - 04
බැදගත් රුලං - 100
රෝස් එසන්ස් තේ හැඳි 03
ආමන්ඩ් එසන්ස් තේ හැඳි 03
වැනිලා තේ හැඳි 03
මී පැණි තේ හැඳි 03
ජෑම් මේස හැඳි 03
( තමන්ගේ කැමැත්ත පරිදි )

සාදා ගන්නා ආකාරය :

- මුලින්ම පලතුරු මිශ්‍රණය පිළියෙල කර ගැනීමට පිරිසිදු කරගත් වීදුරු භාජනයක් සකස් කරගන්න.
- එයට පලතුරු මිශ්‍රණයට යොදන සියලුම පලතුරු කුඩා කොටස් වලට කපා මී පැණි , වැනිලා, සකස් කරගත් කුළුබඩු මිශ්‍රණය සහ එසන්ස් වර්ග දෙක එකතු කර හොඳින් කලවම් කරන්න.
- ඉන්පසු මෙම මිශ්‍රණයට වයින් එක් කර හොඳින් කලවම් කර දින 6 පමණ වසා තබන්න. තමන්ට ඉක්මනින් අවශ්‍ය නම් දින 2/ 3 කින් වුවද මිශ්‍රණය භාවිතයට ගත හැකිය.

කේක් මිශ්‍රණය සාදා ගන්නා ආකාරය :

- සීනි ටික බ්ලෙන්ඩර් කර කුඩු කරගන්න.
- බටර් සහ කුඩු කරගත් සීනි ක්‍රීම් වන තෙක් බීට් කරගන්න.
- මෙම මිශ්‍රණයට බිත්තර කහමද 06 එකින් එක දමමින් බීට් කරගන්න.
- දෙහි ගෙඩියක් පොතු ග්‍රේට් කර එයද මෙම මිශ්‍රණයට එකතු කරගන්න.
- මෙම මිශ්‍රණයට දින 6 කට කලින් සකස් කළ පලතුරු මිශ්‍රණය එකතු කර බැදගත් රුලංද එක් කරගන්න.
- වෙන භාජනයක් ගෙන බිත්තර සුදුමද දමා එයට සීනි හැඳි 03 ක් එක් කර එම මිශ්‍රණය හිම වන තුරු බීට් කරගන්න.
- එම මිශ්‍රණය ද පලතුරු මිශ්‍රණයට එකතු කර හොඳින් කලවම් කර එක අතකට පෙරලන්න.
- කේක් තැටියක් ගෙන එයට ඔයිල් පේපර් යොදා ඒ මත බටර් ආලේප කර සාදාගත් මිශ්‍රණය කේක් තැටියට දමන්න.
- සෙල්සියස් අංශක 130 ක උෂ්ණත්වය යටතේ පැය 2 / 3 බේක් කරගන්න.

සකස් කරගත් කේක් එක නිවුණු පසු කෑම මේසයට එක් කරන්න.

සටහන -
නවෝදි රශිපබා
කැළණිය විශ්වවිද්‍යාලය





# කිතු උපත සමරන්න සැරසෙන කඩවීදි

සීතල දෙසැම්බරය ආරම්භ වීමත් සමඟම අපේ මතකයට නැඟෙන්නේ නත්තලයි. නත්තලේ අසිරිය විඳ ගැනීමට කිතුණු බැතිමතුන් පමණක් නොව බෞද්ධයන් වන අපිත් කැමති වෙයි. ජේසු බිලිඳාගේ උපතත් සමඟ නත්තල පැමිණෙන්නේ දෙසැම්බර් මාසයේ අග භාගයේ වුවත් දෙසැම්බරය පටන් ගනිද්දීම නගරාසන්න විවිධ කඩ හා වීදි නත්තල් සැරසිලි වලින් වර්ණවත් වෙයි.

විශේෂයෙන්ම කොළඹ නගරයේ මෙන්ම කිතුණු බැතිමතුන් වැඩිපුර ජීවත් වන මීගමුව ප්‍රදේශයේ කඩවල් වල මුදලාලි මහත්වරුන්ට මේ ගෙවෙන්නේ හොඳින් අත මිට සරු කාලයක් වෙයි. ඊට අමතරව දිවයින පුරා ඇති කිතුණු දේවස්ථානත්, ජනයන්ගෙන් පිරුණු වීදිත් මේ දිනවල හරි අපූරුවට නත්තල් සැරසිලි වලින් පිරී තිබෙනවා ඔබට දැක ගත හැකි වෙයි. රාත්‍රියට නම් එහි ආකර්ෂණීය භාවය තවත් වැඩිය.

නමුත් කොළඹ - පිටකොටුව නගරයේ වෙනත් වසර වලදී නත්තලට තිබූ කාර්යබහුලත්වය අද වෙද්දී තරමක් අඩුවී තිබේ. නත්තල





ළං වෙද්දී රක්ත වර්ණයෙන්, නෙක විලාසිතා වලින් පිටකොටුව සරසද්දී, චීනයෙන් වැඩි වශයෙන් ගෙන්වූ සැරසිලිවලින් පිරුණු කුඩා තාවකාලික සැරසිලි කඩ තිබුණත් ඒවාගේ වෙනදා තිබූ තදබදය අද තරමක් දුරට අඩු වී තිබේ. මීට හේතුව කුමක්ද යන්න පිටකොටුවේ වෙළෙඳ මහත්වරුන්ගෙන් විමසූ කළ අපට දැන ගන්නට ලැබුණේ මිනිස්සුන්ට වෙනදා තරම් මෙවර නත්තල සැමරීමට මුදල් නොමැතිකමයි.



පමුණුවේ තත්ත්වයද එසේමය. මහරගම පමුණුව යනු ලාභදායී රෙදි පිළිවලට නම් දැරූ නගරයකි. නත්තල් කාලයේ මහරගම ඉතා කාර්යබහුලය. එදා සල්ලි වලින් සාක්කු පුරවා ගත් මිනිසුන් පොරකාගෙන පැමිණ පමුණුවෙන් රෙදි මිලදීගෙන ගියත් අද එවැන්නක් දක්නට නොලැබේ.

"මිනිස්සුන්ට රෙදි ගන්නවා තියා කන්නවත් සල්ලි නැහැ. මේ කාලේ දී වෙනදාට පමුණුවේ සෙනඟ වැහි වැහැලා. ඒකට දැන්.. මිනිස්සු වගේම අපිත් හරි අසරණයි..." පමුණුවේ වෙළෙඳ මහතෙකු අපට කීවේ එසේය.

එමෙන්ම එදා ගාල්ල, මාතර වැනි පිට පළාත්වලින් පමුණුවට ආ වෙළෙඳුන්ට අද ඒමට නොහැකි වී තිබෙන්නේ ඉන්ධන මිල දරාගත නොහැකි මට්ටමට වැඩි වී තිබෙන නිසාවෙනි.

මෙයාකාරයට රටේ ජනතාවට මූල්‍යමය ප්‍රශ්න, ගැටළු තිබුණත් නත්තලට වීදි අලංකාර කිරීමට නම් රජය යුහුසුළුව කටයුතු කරයි. විදුලි බිල කෙතරම් වැඩි වුවත් විදුලි බල්බ දහස් ගණනකින් වීදි ආලෝකමත් කරයි. නෙක රටාවන්ගෙන් සැරසුණු නත්තල් සැරසිලිවලින්ද වීදි සරසයි. නමුත් මෙවැනි වූ අනවශ්‍ය දේට වියදම් නොකර ඒ මුදල් මේ රටේ තුන්වේල කන්නට නොමැති ජනතාවට බෙදා දුන්නා නම් එය කෙතරම් වටිනවාද?

සැරසිලි කළ යුත්තේ වීදිවලට නොව මිනිසුන්ගේ සිත්වලටය. නත්තලට තමාගේ දරුවාට තෑග්ගක් ගෙනයාමට නොහැකි තාත්තලා කොපමණ නම් මේ රටේ ඇතිද?

ජේසුතුමා පවා කීවේ අසල්වැසියාට ප්‍රේම කළ යුතු බවයි. සියලු දෙනාම සතුටින් සිටිය යුතු බවයි. සැබෑ නත්තල එයයි. ඒ නිසාවෙන් හරි හැටි නත්තලේ අරුත වටහා ගෙන කටයුතු කළහොත්, නත්තලට ගජරාමෙට ලස්සන වන කඩවීදි මෙන් අපේ ජීවිතත් ලස්සන කරගත හැකි වනවා නොඅනුමානය.

සටහන -
ඉසුරි එදිරිසිංහ
කැලණිය විශ්වවිද්‍යාල

## ස්වර්ගයේ මඟ

කුමරෙක්ය දෙව් ලොවින් මෙහි ආ
උඳුවපේ සීතල හවස්
ස්වර්ගයේ මඟ දුගී ජනයට
විවර කර දුනි අනුහස්
රජ මැඳුරෙ මෙන් නිවෙන දවසක්
මැටි පැලේ උන්ගේ පවස්
උදා වේවී සැමට එදිනට
අරුත් පිරි නත්තල් යසස්....

| ප්‍රබුද්ධිකා හේරත් |

## මහගෙදර නත්තල

ලස්සනට අපි හිනා වුණු
ලස්සනට අපි එකතු වුණු
මහගෙදර සාලෙ මැද
ආයෙමත් හිනා මල්
හාදු ඉහිරෙන්නට
තව ටිකයි දිනයි ඇත්තේ...

උගුරට බීර බඳුන් හිස් වුණු
කටකට බන්දේසි හිස් වුණු
පාලු ජීවිත මැද
ආයෙමත් හිනා මල්
එළිය කරන්නට
තව ටික දිනයි ඇත්තේ...

සුදු පාට මහගෙදර වටවුණු
බිත්තිවලට තිබුණාලු කන්පෙති
කට හඬක් තිබුණි නම් ඒවට
ලොවට හඬ ගා කියන්නට
කතා නම් මහ හුඟක් ඇත්තේ...

සීතලම නත්තලේ
ලස්සනම කළුවරේ
නත්තලෙ අසිරිය විඳගන්නට
ඔබ එනතුරු රෑ මැද
සැවොම බලාගෙන
ඉන්නව අපි සමිඳේ...

| මලීෂා වීරසූරිය |

## සීත මහේ

සීත මහේ හිම යාය මැදින්
සුදු සේල ඇඳන් ඒ කුමරු වඩියි
මරිය මව්ගෙ ස්නේහයෙන්
කරුණාවයි නුඹ දෙන්නෙ හදින්
නත්තලේ ගවලෙනේ අසිරි මැදින්
තනි තරුවක එළිය අරන්
ආදරයේ උපතකි නුඹ
ජේසු බිළින්දේ

| එච්. ඩී.සඳුනි වාසනා |

## උඳුවප් සීතලයි

උඳුවප් සීතලයි පිණි වැහි වස්සන්නේ....
මැදියම් රැයේ තනි තරුවකි බබළන්නේ....
ජේසු බිළින්දා මෙලොවට බිහිවන්නේ....
සීනු හඬයි නත්තල මේ හිනැහෙන්නේ....

සාමයෙ පණිවිඩය ලොවටම ගෙන එන්නේ....
මනුදම් සිනා සිත්වල මල් පූදින්නේ....
දුරුකර හිත් තැවුල් සමඟිය පැතිරෙන්නේ....
නත්තල අදයි සමරමු හද බැතියෙන්නේ....

| G.D මල්ෂා සම්මානී |



## උඳුවප් පැතුම

ඉපදිලා මිය ඇදෙන  ජීව ගීතිකා තුළ
ගැහැට කම්කටොලු නැති සාමයේ ජීවිතය
ලොව පුරා දනන් හට බෙදී ඉහිරී යන්න
දේවතාවුන් පැමිණ කරුණාව ඉසලන්න
එයයි මේ උඳුවපේ මිහිරිතම මගේ පැතුම

| නිලුක්ෂි කුමාරි |

## නත්තලේ මිහිර

ශීත ඍතුව වැලඳ ගැනීමේදී, නත්තලේ
මිහිර ළඟ ළඟම ඇසේ,
හිම පියලි නම් අගේට නටමින්, උත්සව
ප්‍රීතියෙන් සතුට  මුමුණති.
කරුණාවෙන් සැරසුණ  නත්තල් ගස
ආලෝකයෙන් බබළයි.
ඉන්ද්‍රජාලික වැලඳ ගැනීමක් ලෙස  නත්තල
පැමිණේ .

| ඩී.එම්.ජේ .චානිකා |

## සාමේ කුමරු

තුටින් ලෝ සැම සාමේ පණිවිඩය ඔබ වෙත තබනා...
කුමරු වඩිනා පින්වත් දිනය එදා...
සාමේ කුමරු සපැමිණි ලොවම  තුටින් උඳුවප් මහේ මෙදා...
ආදරයේ අර්ථය ලොවට ප්‍රකාශිත සීත මහේ උදාවයි  බබළනා...
ලොවක් සරසන නත්තලයි මේ උදා වෙනා

| එස්. රශ්මි කෞශල්‍යා ප්‍රියසාද් |



# නත්තල හැඩ කරන සැරසිලි









නිවාඩු කාලය තුළ නිවෙස් සහ පොදු ස්ථාන උත්සව ආශ්චර්යමත් භූමි බවට පරිවර්තනය කිරීමේදී නත්තල් සැරසිලි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙම ආභරණ නත්තලට සම්බන්ධ ප්‍රීතිය පිළිබඳ දෘශ්‍ය ප්‍රකාශනයන් ලෙස ක්‍රියා කරයි. එසේම මිනිසුන් එකට එකතු කරන සිත් ඇදගන්නා සුළු වාතාවරණයක් නිර්මාණය කරයි.

වඩාත්ම කැපී පෙනෙන සැරසිලි වලින් එකක් වන්නේ නත්තල් ගස, විදුලි පහන්, විසිතුරු භාණ්ඩ සහ දිලිසෙන ගස් මුදුනකින් සරසා ඇත. ගස් අලංකාර කිරීමේ සම්ප්‍රදාය සියවස් ගණනාවකට පෙර දිවෙන අතර ජීවිතය, බලාපොරොත්තුව සහ සදාකාලික ආත්මය සංකේතවත් කරයි. ගස මත ඇති දිලිසෙන විදුලි පහන්, උත්සව වාතාවරණයට ස්පර්ශයක් එක් කරමින්, ප්‍රඥාවන්තයින් බෙත්ලෙහෙමට ගෙන ගිය මඟ පෙන්වන තරු නියෝජනය කරයි. නත්තල් සැරසිලි, වීදි, නිවාස සහ වෙළඳසැල් ඉදිරිපිට ආලෝකමත් කිරීම සඳහා වර්ණවත් ආලෝකයන් කැපී පෙනේ. මෙම ආලෝකයේ දීප්තිය සංකේතවත් කරන්නේ අන්ධකාරය මත ආලෝකයේ ජයග්‍රහණය, බලාපොරොත්තුව සහ අලුත් කිරීම යන යටින් පවතින තේමාව පිළිබිඹු කරයි. සම්භාව්‍ය සුදු ආලෝකයේ සිට විචිත්‍රවත් බහු-වර්ණ සංදර්ශක දක්වා, සෑම තේරීමක්ම නත්තල් සැමරුම්වල අද්විතීය ස්වභාවයට දායක වේ.

අතින් සාදන ලද සහ සාප්පුවෙන් මිලදී ගත් විසිතුරු භාණ්ඩ, හැඟීම්බර වටිනාකමක් ඇති අතර නත්තල් සැරසිලි බොහෝ විට වසර ගණනාවක් පුරා විසිතුරු භාණ්ඩ එකතුවක් රැස් කර ගනී, ඒ සෑම එකක්ම කථාවක් පවසමින් හෝ විශේෂ අවස්ථාවක් සලකුණු කරයි. මෙම ආභරණ ගස මත එල්ලීම ආදරණීය සම්ප්‍රදායක් බවට පත්ව ඇත. සදාකාලිකත්වය සංකේතවත් කරන වෘත්තාකාර හැඩයෙන් යුත් මල් සැරසිරි නිවාඩු කාලය තුළ දොරවල් සහ බිත්ති අලංකාර කරයි. සදාහරිත අතු, පයින්කෝන් සහ රිබන් වැනි විවිධ ද්‍රව්‍ය වලින් සාදන ලද මෙම මල් සැරසිරි අමුත්තන් උත්සවාකාරයෙන් වැලඳ ගනී. ඔවුන් නිවාසවල දෘශ්‍ය ආකර්ෂණය වැඩි දියුණු කරනවා පමණක් නොව සම්ප්‍රදාය සහ අඛණ්ඩතාව පිළිබඳ හැඟීමක් ද ඇති කරයි.

නත්තල් උදෑසන අපේක්ෂාව සහ ප්‍රීතිය ග්‍රහණය කරන්නේ කුඩා ත්‍යාග හෝ සංග්‍රහ සමඟ තොග පිරවීමේ සම්ප්‍රදාය විස්මයේ සහ ප්‍රීතියේ අංගයක් එක් කරමිනි. මෑත වසරවලදී, එළිමහන් සැරසිලි වැඩි වැඩියෙන් විස්තීර්ණ වී ඇති අතර, සමස්ත අසල්වැසියන් උත්සව නිර්මාණශීලීත්වයේ මිත්‍රශීලී සංදර්ශන සඳහා තරඟ කරයි. පිම්බෙන භාණ්ඩ, ආලෝක සංදර්ශන සහ තේමා සැරසිලි මඟින් වීදි දුර බැහැර සිට පැමිණෙන අමුත්තන් ඇද ගන්නා විස්මිත සංදර්ශන බවට පත් කරයි.

සාරය වශයෙන්, නත්තල් සැරසිලි හුදෙක් සෞන්දර්යය ඉක්මවා යයි; ඔවුන් දීමේ, ප්‍රීතියේ සහ එකමුතුකමේ ආත්මය මූර්තිමත් කරයි. නිවෙස්, පොදු අවකාශයන්, හෝ සමස්ත ප්‍රජාවන් අලංකාර කළත්, මෙම උත්සව සැරසිලි මිනිසුන් සැමරීමේ දී එක්සත් කරන හවුල් අත්දැකීමක් නිර්මාණය කරයි. නත්තලට අලංකාර කිරීමේ සම්ප්‍රදාය අවට පරිසරය අලංකාර කරනවා පමණක් නොව නිවාඩු කාලය නිර්වචනය කරන ප්‍රජාව සහ උණුසුම පිළිබඳ හැඟීමක් ද ඇති කරයි.

සටහන -
දුලාංජලී හේරත්

# නත්තල් අත්කම් නිවසේදීම සදමු

දෙසැම්බර් මාසය පැමිණි සැණින් නත්තල් අසිරියෙන් පරිසරය හැඩ වෙනවා. නත්තල කියලා කියන්නේ ලොව පුරා කතෝලික බැතිමතුන්ගේ ඉහළතම සැමරීමක්. අද වන විට සියල්ලම පාහේ නත්තල් උත්සවය විචිත්‍රවත් කර ගැනීමට බොහෝමයක් සැරසිලි යොදා ගන්නවා. ඊට අමතරව මේ පාර නත්තල වර්ණ ගන්වන්න ඔබට නිවසේ දීම සාදා ගත හැකි අපූරු සැරසිලි කිහිපයක් ගැන තමයි මේ අතිරේකය වෙන් වෙන්නේ.

## ■ වෙනස් විදියේ නත්තල් ගසක්



නත්තලත් එක්ක බැඳුණු ප්‍රධානතම සැරසිල්ල තමයි නත්තල් ගස කියලා කියන්නේ. මෙම සැරසිල්ලට වුවමනා කේක් ස්ටෑන්ඩ් එකක් සහ නත්තල් ඕර්නමන්ට්ස් කිහිපයක් පමණයි. කේක් ස්ටෑන්ඩ් එකක් නොමැති නම් ලස්සන වීදුරු කිහිපයක් සහ පිඟන් කිහිපයක් එක මත එක එනසේ තබා ස්ටෑන්ඩ් එක සකසාගත හැකියි. රිබන් ලූප්ස් කිහිපයක් සහ කුඩා බල්බ් වැලක් එකතු කර ගතහොත් වැඩි ලස්සනක් එකතු කරගන්න පුළුවන්.

- **Christmas Jar Ornament**

විනිවිද පෙනෙන වීදුරු බෝතලයක් තුළ කරනු ලබන සැරසිල්ලකි.




අවශ්‍ය පරිදි බෝතලය තුළට නත්තල් ඕර්නම-න්ට්ස් දමා නිම කර ගත හැක. තවත් අලංකාර කර ගැනීම සඳහා fairly lighths ද යොදා ගත හැක. බෝතලයේ මූඩිය සහ බෝතලයේ පිට සැරසීමට රිබන්, හෝලි කිනිති ආදිය යොදා ගත හැක.

- **Stars**

අයිස් ක්‍රීම් කෝටු (**sticks** ) 4ක් ගෙන ඒවා අවශ්‍ය පරිදි දිලිසෙන කුඩු අලවා හැඩ ගන්වා ගන්න. ඉන්පසු කතිර දෙකක් සාදා එම කතිර ද්විත්වය තරුවක් ආකාරයෙන් තබා අලවා ගන්න. එය අවශ්‍ය පරිදි ස්ථාන ගත කිරීම සඳහා පිටුපසින් කුඩා නූලක් තබා අලවා ගත හැකිය.

## ■ රස්ටික් කැන්ඩ්ල්ස්



ප්‍රමාණ කිහිපයකින් යුත් ඉටිපන්දම් කිහිපයක්, වේලුණු පයින් ගෙඩි කිහිපයක්, හණ ලණු, බර්ලැප් බෝ එකක් සහ පබළු කිහිපයක් එකතු කරගෙන ඉතාම පහසුවෙන් මෙම සැරසිල්ල සකසාගත හැකියි.

## ■ පොයින්ට්සෙටියා සැරසිල්ල



නත්තල් ඕර්නමන්ට්ස් කිහිපයක් විනිවිද පෙනෙන වීදුරු බඳුනකට දමා ඒ මතට පොයින්ට්සෙටියා මල් සහ කොළ කිහිපයක් එකතු කරගනිමින් මෙය සාදා ගත හැකිය. මේ සඳහා නැවුම් පොයින්ට්සෙටියා මල් වුවත් එකතු කරගත හැකියි. කෑම මේසයට හෝ තේ මේසයට ගැලපෙන මෙම සැරසිල්ල නිම කිරීමට ගතවන්නේ විනාඩි කිහිපයක් පමණයි.

## ■ ක්‍රිස්මස් ටවර්ස්



ප්‍රමාණ කිහිපයකින් යුත් වීදුරු බඳුන් කිහි-පයකට හාල්, රිජිෆෝම් බෝල හෝ සුදු පැහැති පබළු බඳුනෙන් ¼ ක් පමණ පුරවා නත්තල් ඕර්නමන්ට්ස් සහ වර්ණ ගන්වා ගත් පයින් ගෙඩි කිහිපයක් යොදාගෙන සරසාගන්න.විසිත්ත කාමරයට වැඩි එළියක් ගෙන දීමට මෙම නිර්මාණයට හැකිය.

මෙවර නත්තලේ දී නිවසේ දී ම අඩු වියදමකින් සහ අඩු මහන්සියකින් වැඩි එළියක් ගෙන දෙන්නට මෙම සැරසිලි ඔබට උපකාරී වේවි.

සටහන -
ඩබ්ලිව්. නිලුක්ෂි කුමාරි
කැලණිය විශ්වවිද්‍යාලය







# කැරොල් ගීතයේ ඇරඹුම.

නත්තලේ සිරි අසිරි මවමින් හුදී ලෝකවාසී ජනයා නත්තල් බැති ගී ගයා නත්තලේ සැබෑ අරුත ඒකාලෝක කරනු ලබයි. ලෝකේ පළමු නත්තල් බැති ගීය 4 වෙනි සියවසේ රෝමයේදී නිර්මාණය වූ බව සැලකේ.



කාලය ගත වීමත් සමඟම 12 වෙනි ශත වර්ෂය වන විට එකල තිබූ ප්‍රසිද්ධ සිංදු මෙලඩි වලට නත්තල් ගීත ලියා මිනිස්සුන්ට දැනෙන ආකාරයට නත්තල් ගීත සෑදුණ බව ඉතිහාසයේ සඳහන් වේ.

13 වන ශත වර්ෂයේ දී ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය වැනි රටවල නත්තල් ගීත ජනප්‍රිය වූ අතර ඒ.ජෝන් ඕඩ්ලේ දේවගැති තුමාගේ උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස ඉංග්‍රීසියෙන් ලියවුණු නත්තල් බැතී ගීත 25ක ඇල්බමයක් ක්‍රි.ව. 1426 දී නිර්මාණය විය. මෙකී නත්තල් ගීත කොටස් කිපයකි.

1. නත්තල් ගී /කැරොල් ගී
2. පසම් ගී
3. කන්තාරු ගී

කැරොල් ගීත යනු විනෝදය මුසු වුණ ගීත විශේෂයකි. විශේෂයෙන්ම පල්ලියක් ඉදිරිපිට කණ්ඩායමක් මේ ගීත ගායනා කරනු ලබයි. කැරොල් හරහා සතුට , සෞභාග්‍ය සංකේතවත් කරයි. පසම් ගීත ගායනා කරනු ලබන්නේ ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය නිමිති කරගෙන වේ. පසම් ගී දේවස්ථානයක වුවද අඩුවෙන් ගායනා කරන අතර සමූහ ගායනයන් සිදු කරයි. කන්තාරු යනු දේවස්ථාන වල ගායනා කරන ස්තෝත්‍ර වේ.කත්තාරු ගීතිකා දේව මෙහෙයකදී පූජකයන් විසින් සහ බැතිමතුන් විසින් ද ගයනු ලැබේ.

කැරොල් ගීතයේ ඇරඹුම. ලන්දේසි යුගයේ දී ලංකාවට පැමිණි ජුසේ වාස් පියතුමාගේ සහායක පූජකතුමෙක් වුණ ජාකොම් ගොන්සාල්වේස් පියතුමා විසින් 1730 දී මංගල ගීතය නම් පොතක් රචනා කර ඇත.අත් අකුරු පිටපතක් විදිහට තිබූ මේ කෘතිය 1873 දී මුලින්ම සංස්කරණය කර මුද්‍රණය කිරීමේ සම්පූර්ණ වගකීම දරා ඇත්තේ සිංහල භාෂාවේ පඬිතුමෙක් වන ඩොමින්ගෝ විජයසිංහ කතෝලික මුදලිතුමයි. මුඛ පරම්පරාවෙන් පැවත ආ "දෙව්ඳු උපන්නේය සතුනි " ගීතය 1967 දී නයිනමඩමේ සංගීතඥයෙක් වුණ ජේ.කේ.එස්. පෙරේරා මහතා අපරදිග ස්වර ලිපියකට නගන්නට විය. එමෙන්ම රජතුන් කට්ටුව නම් නාඩගම් ඇසුරින් නත්තල් නාඩගම් ගීත කලාවක් බිහි විය. විදෙස් නත්තල් ගීත ආභාෂයෙන් බැහැර වී ලංකාවේ නත්තල් ගීත නිර්මාණය වන්නට වූයේ මර්සලීන් ජයකොඩි පියතුමාගෙනි. 1934 දී එතුමා පද රචනයෙන් සහ තනු නිර්මාණයෙන් දායක වූ "රෑ තරු බබලනවා" ගීතය නිර්මාණය කරන ලදී. මෙලෙසින් නත්තල හැඩ කරන ගීතිකාවල උපත සනිටුහන් විය.

සටහන -
බුද්ධිකා දිල්හානි.
කැළණිය විශ්වවිද්‍යාලය

# Marry Christmas



## නත්තලේ සමාරම්භය

උඳුවප් මාසයේ ගෙවී යන කාර්තුවක
ළඟා වී ඇත නත්තලේ  සමාරම්භය
බෙත්ලෙහෙමේ ගවහල මත
මරියා මව්ගේ පින්බර කුසෙන්
ජන්ම ලාභී විය එදවස ජේසු සමිඳුන්
සැමට එක ලෙස
ප්‍රේම කරන්න ...
එතුමන්ගේ වචනයයි....
නත්තලේ සීනු හඬින්
නත්තලේ ගීතිකා තුළින්
නත්තල් විශේෂාංගය පුරා
එලෙසින් වර්ණවත් වන්නේද
එම වචනයයි
ඉතින්,
ජේසු සමිඳු උපන් දිනදා
පතන්නම් මෙලෙසින්
ඔබට සුබ නත්තලක්

| ඩිනූ සල්ගමුවගේ |

## මෙවර කලාපයේ කතුවරුන්

- ප්‍රබුද්ධිකා හේරත්
- නවෝදි රශිපබා
- ඉසුරි එදිරිසිංහ
- දුලාංජලී හේරත්
- නිලුක්ෂි කුමාරි
- බුද්ධිකා දිල්හානි
- ඩිනූ සල්ගමුවගේ
- මල්ෂා සම්මානී
- එච්. ඩී.සඳුනි වාසනා
- මලීෂා වීරසූරිය

## සංස්කරණය

- තුෂාන් බණ්ඩාර
- සුලෝචනා නදීෂානි
- හිමාෂා රණතුංග
- පබසරා ගීවින්දි

## අධීක්ෂණය

- ප්‍රියශාන් මදුසංක
- තුෂාන් බණ්ඩාර

## වෙබ් සංස්කරණය

- චතුර කවිදු

නවයකරණයෙන් ඉදිරියට
ඩිජිටල් කළාවේ නවතම පෙරළිය
Pawura Digital Magazine
All images are copyrighted by their original owners

9 772961 526004